# කරණීය මෙත්ත සූත්‍රය

**කරණීයමත්ථ කුසලේන, යංතං සන්තං පදං අභිසමෙච්ච**
**සක්කෝ - උජූ ච - සූජූ ච**
**සුවචෝ චස්ස - මුදු - අනතිමානි**

අභිවෘද්ධියෙහි දක්ෂයා විසින් ශාන්ත පදය යි කියන ලද
නිර්වාණයට පැමිණ වසනු කැමැත්තේ මෙසේ කටයුතුය.
දක්ෂයෙක් විය යුතුය. ඍජු විය යුතුය. මනා කොට ඍජු විය යුතුය.
කීකරු තැනැත්තෙක් විය යුතුයි. මෘදු විය යුතුයි. මාන නැත්තෙක් විය
යුතුයි.

**සන්තුස්සකෝ ච - සුභරෝ ච**
**අප්පකිච්චෝ ච - සල්ලහුකවුත්ති**
**සන්තින්ද්‍රියෝ ච - නිපකෝ ච**
**අප්පහබ්බෝ - කුලේසු අනනුගිද්ධෝ**

ලද දෙයින් සතුටු වන්නෙක් ද, පහසුවෙන් පෝෂණය කළ හැක්කෙක්
ද,
ස්වල්ප කටයුතු ඇත්තෙක් ද, සැහැල්ලු පැවතුම් ඇත්තෙක් ද,
සන්සුන් ඉඳුරන් ඇත්තෙක් ද, නුවණැත්තෙක් ද,
හැඩි දැඩි ගති නැත්තෙක් ද, කුලයෙහි නොඇලෙන්නෙක් ද විය
යුතුයි.

**න ච ඛුද්ධං සමාචරේ, කිඤ්චි යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං**
**සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු**
**සබ්බේ සත්ථා භවන්තු සිඛිතත්තා**

නුවණැති අන්‍යයන් නින්දා කරන සුළු වරදක් නොකරන්නේය.
සියළු සත්වයෝ සුවපත් වෙත්වා! නිර්භය වෙත්වා!
සුඛිත සිත් ඇත්තෝ වෙත්වා!

**යේ කේචි පාණභූතත්ථි**
**තසා වා ථාවරා වා අනවසේසා**
**දීඝා වායේ මහන්තාවා**
**මජ්ඣිමාරස්ස බාණුකථූලා**

කෙලෙස් සහිත සත්වයෝ ද, නිකෙලෙස් සත්වයෝ ද,
කිසියම් සත්ව කෙනෙක් ඇත්නම් ඒ සියළු දෙනා ද,
දික් වූ ශරීර ඇත්තෝ ද, මහත ශරීර ඇත්තෝ ද,
මධ්‍යම ශරීර ඇත්තෝ ද, ඉතා මිටි ශරීර ඇත්තෝ ද, ඉතා සියුම් ශරීර ඇත්තෝ ද, ස්ථූල ශරීර ඇත්තෝ ද,

**දිට්ඨා වා යේව අද්දිට්ඨා**
**යේ ච දූරේ වසන්ති අවිදූරේ**
**භූතා වා සම්භවේසී වා**
**සබ්බේ සත්ථා භවන්තු සුඛිතත්තා**

දක්නා ලද සත්වයෝ ද, නොදක්නා ලද සත්වයෝ ද,
දුර වසන සත්වයෝ ද, ළඟ වසන සත්වයෝ ද,
ඉපදුණු සත්වයෝ ද, ඉපදෙමින් සිටිනා සත්වයෝ ද,
යන සියළු සත්වයෝ සුවපත් වෙත්වා!

**න පරෝ පරං නිකුබ්බේථ**
**නාතිමඤ්ඤේථ කත්ථචි නං කඤ්චි**
**බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා**
**නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය**

එකෙක් අනෙකකු කිසි තැනෙකත් වංචා නොකෙරේවා!
කිසි තැනෙකත් කිසිවෙකුට අවමන් නොකෙරේවා!
කෝපයෙන් ද, ද්වේශයෙන් ද,
ඔවුනොවුන්ට දුක් කැමති නොවේවා!

**මාතා යථා නියං පුත්තං**
**ආයුසා ඒකපුත්තමනුරක්ඛේ**
**ඒවම්පි සබ්බ භූතේසු**
**මානසං භාවයේ අපරිමාණං**

යම් මවක් තම එකම පුත්‍රයා
දිවි පුදා රකින්නී ද
එපරිද්දෙන් සියළු සත්වයන් කෙරෙහි
අප්‍රමාණ වූ මෙත් සිත වඩන්නේ ය.

**මෙත්තඤ්ච සබ්බලෝකස්මිං**
**මානසං භාවයේ අපරිමාණං**
**උද්ධං - අධෝච - තිරියං ච**
**අසම්බාධං අවේරං අසපත්තං**

සියළු ලෝකයා කෙරෙහි
අප්‍රමාණ මෙත් සිත වඩන්නේය.
උඩද, යට ද, සරස ද,
කරදර නැති වෛරයක් නැති සතුරන් නැති මෙත් සිත වඩන්නේ ය.

**තිට්ඨං චරං නිසින්නෝ වා**
**සයානෝ වා යාව තස්ස විගතමිද්ධෝ**
**ඒතං සතිං අධිට්ඨෙය්‍ය, බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු**

සිටිමින් හෝ යමින් හෝ හිඳිමින් හෝ
සැතපෙමින් හෝ මේ මෛත්‍රිය වැඩිය යුතුය.
මෙය ශාසනයේ බ්‍රහ්ම විහාර යයි කියත්.

**දිට්ඨිඤ්ච අනුපගම්ම සීලවා**
**දස්සනේන සම්පන්නෝ**
**කාමේසු විනෙය්‍ය ගේධං**
**න හි ජාතු ගබ්බසෙය්‍යං පුනරේතීති.**

මේ බ්‍රහ්ම විහරණයෙන් යුතු තැනැත්තා
වැරදි දෘෂ්ඨියකට නොපැමිණ සිල්වත්ව සෝවාන් මාර්ග ඥාණයෙන් යුක්තව
කාම තෘෂ්ණාව දුරු කොට
නැවත මව් කුස පිළිසිඳ ගැනීමට නො එන්නේය.